සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - සති පාසල

**1. ශ්‍රේණිය** :- 11 ශ්‍රේණිය **විෂය** :- චිත්‍ර **අදාළ සතිය** සැප්තැම්බර් 5 වන සතිය

**2.පාඩම/ ඒකකය**:-6.3.2 හෙන්රි මුවර් ශිල්පියාගේ නිර්මාණ අගයමු.

**.3. ශිෂ්‍යයා කළ යුතු කාර්යයන්:-**

- හෙන්රි මුවර් ශිල්පියාගේ නිර්මාණ හොඳින් නිරීක්ෂණය කරන්න.
- ඔබට සපයා ඇති කියවීම් පත්‍රිකාව හොඳින් අධ්‍යයනය කරන්න.

  පහතින් දක්වා ඇති ක්‍රියාකාරකම්වල නිරතවන්න.

  1. හෙන්රි මුවර් ශිල්පියා පිළිබඳ කෙටි විස්තරයක් කරන්න.
  2. පහත සඳහන් කරුණු සැලකිල්ලට ගනිමින් හෙන්රි මුවර් ශිල්පියාගේ නිර්මාණ පිළිබඳ ඇගයීමක් කරන්න.

     i. තේමාව

     ii. ශෛලිය

     iii. ආභාස

     iv. මාධ්‍ය

     v. ශිල්ප ක්‍රමය

     vi. කලා ලක්ෂණ

       - සම්පිණ්ඩන ලක්ෂණ
       - රිද්මය, මතුපිට ස්වභාවය
       - භාව/හැඟීම් හා සමස්ත ප්‍රකාශනය

හෙන්රි මුවර් **(1898-1986)**

- හෙන්රි මුවර් (Henry Moore) 1898 දී එංගලන්තයේ යෝක්ෂයර් (Yorkshire) ප්‍රාන්තයේ කාසල් ෆෝර්ඩ් නුවර උපත ලැබී ය.
- ග්‍රීක රෝම කලාවේ හා පුනරුද යුගයේ පැවති සාම්ප්‍රදායික මූර්ති නිර්මාණවලින් පසුව නව ආරක මූර්ති කලාවක් ලොවට හඳුන්වා දීමට පුරෝගාමී වූයේ හෙන්රි මුවර් ශිල්පියා ය.
- හෙන්රි මුවර් එතෙක් පැවති දෘශ්‍ය තාත්ත්වික භාවයට වෙනස් වූ වියුක්ත හැඩ මූර්ති ශිල්පයට අනුගත කළ ශිල්පියා වශයෙන් හැඳින්විය හැකි ය.
- ඔහුගේ මානව මූර්ති නිර්මාණ ස්වභාවික පෙනුමෙන් හා ස්වභාවික පරිමාණයෙන් දුරස්වීම පැහැදිලි ලක්ෂණයකි.
- මානව රූපයේ ශරීර හැඩ ඉතා සරල ව නිර්මාණය වීම විශේෂ ලක්ෂණයකි.
- විශාල ප්‍රමාණ ශරීර සහිත වූ මානව රූපවල ඇති හිස කුඩාවට නිරූපණය කිරීම හෙන්රි මුවර්ගේ කෘතිවල දැකිය හැකි වූ ආවේණික ලක්ෂණයකි.
- මුල්කාලීන කෘතීන්වල මිනිස් රුව පැහැදිලි ලෙස මූර්තිමත් කළ ද පසුව ක්‍රමයෙන් සරල වූ හැඩවලට සීමා කරන ලද්දේ ය.
- හෙන්රි මුවර්ගේ මූර්තිවල මූලික තේමාව වූයේ මානව රූපයයි. එවැනි මූර්ති අතර,
  - රජ පවුල
  - වැතිර සිටින රුව සුවිශේෂ ස්ථානයක් ගනී.
- ඔහුගේ නිර්මාණ බොහොමයක් උද්‍යාන මූර්ති වශයෙන් නිර්මාණය වී තිබේ.
- විශාල ලෙස නිර්මාණය කරන මානව රූප මූර්තිමත් කිරීමේ දී කොටස් කිහිපයකින් යුතුව නිර්මාණය කර දක්වයි.
- මූර්ති නිර්මාණ කිරීමේදී භාවිත අමුද්‍රව්‍ය වෙනස් කළ හෙන්රි මුවර් ඒ සඳහා දුව සහ ලෝකඩ, ආදී ද්‍රව්‍ය ආදේශ කරගන්නා ලදි. ඒවා අව්, වැසි, සුළං තත්ත්වයන්ට ඔරොත්තු දීමට හැකිවන මාධ වීම සුවිශේෂත්වයකි.
- අමුද්‍රව්‍ය මෙන් ම මූර්ති මූලධර්ම හා ශිල්ප ක්‍රම ද වෙනස් කළ ශිල්පියෙකි.

රජ පවුල (King and Queen)



- ස්වභාවික හා තාත්වික හැඩ දැනවීම වෙනුවට නිරූපණාත්මක සහ වියුක්ත හැඩ භාවිත කළ මූර්ති නිර්මාණයක් වශයෙන් රජ පවුල නැමති මූර්තිය හැඳින්විය හැකි ය.
- මෙහි මානව හැඩ ස්වභාවික පෙනුමෙන් හා ස්වභාවික පරිමාණයෙන් දුරස් ව නිරූපණය කර තිබේ.
- හිඳ සිටින ඉරියව්වෙන් නිර්මාණය කර ඇති මෙහි ස්ත්‍රී පුරුෂ හැඩ ඔහුට ම ආවේණික ශෛලියක් තුළ නිර්මාණය කර ඇත.
- මානව රූප ඉතා සරලව හා කොටස් කිහිපයකින් යුතු ව නිර්මාණය කර ඇත.
- විශාල ප්‍රමාණයේ ශරීරය සමඟ හිස කුඩාවට නිරූපණය කිරීම දැකිය හැකි ය.
- සාම්ප්‍රදායික මූර්තිමය ද්‍රව්‍ය වෙනුවට වෙනත් මාධ්‍ය ලෙස ලෝකඩ භාවිත කරමින් කරන ලද නිර්මාණයකි.
- ලෝකඩ මාධ්‍ය නිර්මාණයක් වන මෙය වාත්තු කිරීමේ ශිල්පක්‍රමය අනුව නිර්මාණය කරන ලද්දකි.
- මෙම මූර්තිය උද්‍යාන මූර්තියක් වශයෙන් නිර්මාණය කර ඇත.

වැතිර සිටින රූපය (Reclining figure)



- වැතිර සිටින ආකාරයෙන් නිර්මාණය කර ඇති මෙම රූපය තුළින් වියුක්ත හැඩ දක්නට ලැබේ.
- ස්වභාවික පෙනුමෙන් හා ස්වභාවික පරිමාණයෙන් දුරස් වූ හැඩ භාවිත කිරීම හෙන්රි මුවර්ගේ මූර්තිවල දැකිය හැකි විශේෂ ලක්ෂණයකි.
- මාධ්‍ය හා මූර්ති නිර්මාණය කිරීමේ මූලධර්ම වෙනස් කිරීමට ගත් උත්සාහයක ප්‍රතිඵලයක් ලෙස මෙම නිර්මාණය හැඳින්විය හැකි ය.
- දිගටි හෝ විවර සහිත හැඩ රිද්මයානුකූල ව හා සමබර ව අවකාශය සමඟ භාවිත කර ඇත.
- ලෝකඩ මාධ්‍යයෙන් හා ලෝහ වාත්තු කිරීමේ ශිල්ප ක්‍රමය අනුව නිර්මාණය කරන ලද නිර්මාණයකි.
- ඉදිරියට නෙරාගිය හා ඇතුළට නෙරාගිය කොටස් සහිත විස්තරාත්මක බවෙන් අඩු සරල හැඩ මෙහි දැකිය හැකි ය.
- මානව ශරීරයේ හැඩ සරල ව නිරූපණය කිරීම හා එම ශරීර හැඩවලට සාපේක්ෂව හිස කුඩාවට නිරූපණය කිරීමේ විශේෂ ලක්ෂණ මෙහි දකිය හැකි ය.

**4.ඉහත ක්‍රියාකාරකම සඳහා උපකාර කරගත හැකි ඉගෙනුම් ආධාරක :-**

e - නැණ පියස:- 11 ශ්‍රේණිය චිත්‍ර කලාව
11 ශ්‍රේණිය චිත්‍ර කලාව අතිරේක කියවීම් පොත - ජාතික අධ්‍යාපන ආයතනය
https://www.youtube.com/watch?v=0b0cxYPQcUw

**5.ඉගෙනුම් ඵල :-**

- හෙන්රි මුවර් ශිල්පියාගේ නිර්මාණ හඳුනාගෙන නම් කරයි.
- නූතන මූර්ති කලාව සඳහා ඔහුගෙන් සිදු වූ සේවය හා කලා ක්‍රියාකාරිත්වය විමසා බලයි.
- නිර්මාණ සඳහා පදනම් වූ ශෛලිය හා සම්පිණ්ඩණ ලක්ෂණ විස්තර කරයි.
- හෙන්රි මුවර් ශිල්පියාගේ නිර්මාණවල කලා ලක්ෂණ රස විඳිමින් ඇගයීමට ලක් කරයි.

**සැකසුම** :- කෑගල්ල අධ්‍යාපන කලාපය